GIT/2026/S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

GIT | S | I, II

සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය 2026
பொதுத் தகவல் தொழில்நுட்பப் பரீட்சை 2026
General Information Technology Examination 2026

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය	I, II
பொதுத் தகவல் தொழில்நுட்பவியல்	I, II
General Information Technology	I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය	- මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம்	- 10 நிமிடங்கள்
Additional Reading Time	- 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I

උපදෙස්:

- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- පිළිතුරු පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
- පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
- **1** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **පිළිතුරු පත්‍රයේ පිටුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (×) යොදා දක්වන්න.**


1. පාසලක් මගින් පවත්වාගෙන යනු ලබන සම්බන්ධක දත්ත සමුදායක ඇති ශිෂ්‍ය (student) වගුවක් පහත දැක්වේ.

Student_ID	Name	Date_of_Birth	Class	Contact_No
S001	Amal	2007-05-12	12A	0771234567
S002	Nimal	2007-08-21	12B	0712345678

පහත කුමන ක්ෂේත්‍රයක් (field) ප්‍රාථමික යතුර (primary key) සඳහා වඩාත් යෝග්‍ය වන්නේ ද?
(1) Class (2) Date_of_Birth (3) Name (4) Student_ID

2. HTML ලේඛනයකට විවරණයක් (comment) එකතු කිරීම සඳහා පහත ඒවායින් නිවැරදි ක්‍රමය කුමක් ද?
(1) `// This is a comment` (2) `<!-- This is a comment -->`
(3) `/* This is a comment */` (4) `<comment>This is a comment</comment>`

3. මෙහි දක්වා ඇති රූපය මගින් ඉදිරිපත් කෙරෙන නිවැරදි ජාල ස්ථලකය (network topology) පහත ඒවායින් කවරක්ද?
(1) තාරුකා (Star) (2) බස (Bus)
(3) මුදු (Ring) (4) රුක් (Tree)



4. පහත සඳහන් ඒවා අතුරෙන් ද්විතීයික ආචයන උපාංගයක් වන්නේ කුමක් ද?
(1) දෘඪ තැටිය (Hard disk) (2) සසම්භාවී ප්‍රවේශ මතකය (RAM)
(3) පඨන මාත්‍ර මතකය (ROM) (4) රෙජිස්තරය (Register)

5. තොරතුරුවල දෘඪ පිටපතක් ලබාගැනීමට ප්‍රාථමික වශයෙන් භාවිත කරනු ලබන්නේ පහත කවර උපාංගයක ද?
(1) මුද්‍රණ යන්ත්‍රය (2) තිරය (3) ස්පීකරය (4) ප්‍රක්ෂේපකය

6. මුද්‍රණ යන්ත්‍රයක් පරිගණකට සම්බන්ධ කිරීමේ දී භාවිත කළ හැකි වන්නේ පහත සඳහන් කවර කෙවනිය ද?
(1) HDMI (2) USB (3) VGA (4) DVI

7. ජද්ධති මෘදුකාංගයකට උදාහරණයක් වන්නේ පහත කවරක් ද?
(1) මෙහෙයුම් පද්ධතිය (2) වදන් සකසනය (3) පැතුරුම්පත (4) වෙබ් අතරික්සුව

8. චිත්‍රයක් දර්ශනය කළ නොහැකි අවස්ථාවක ඒ සඳහා විකල්ප පාඨයක් සපයන HTML උපලක්ෂණය (attribute) කුමක් ද?
(1) `title` (2) `name` (3) `alt` (4) `text`

9. ප්‍රතිවෛරස මෘදුකාංගයක් උදාහරණයක් වන්නේ,
(1) යෙදුම් මෘදුකාංගයකට ය. (2) උපයෝගීතා මෘදුකාංගයකට ය.
(3) උපක්‍රම ධාවකයකට ය. (4) මෙහෙයුම් පද්ධතියකට ය.

10. යතුරු පුවරුවක කුමන කාර්ය යතුර (function key) සමර්පණයක කදා දැක්ම (slide show) මුල සිට ක්ෂණිකව ආරම්භ කිරීමට භාවිත කළ හැකි ද?
(1) F1 (2) F5 (3) F12 (4) Esc

11. රැහැන් රහිත පාදක මධ්‍යස්ථානයක (base station) ප්‍රධාන කාර්යක් වන්නේ,
(1) රැහැන් රහිත උපාංග රැහැන් සහිත හෝ රැහැන් රහිත ජාල සඳහා සම්බන්ධ කිරීමයි.
(2) සම්බන්ධිත උපාංගවල සැකසුම් වේගය වැඩි කිරීමයි.
(3) සියලුම වර්ගයේ වෛරසවලින් ජාලය ආරක්ෂා කිරීමයි.
(4) ජාලය තුළ දත්ත ස්ථිරව ගබඩා කර තබා ගැනීමයි.

12. ඔබේ සමර්පණයට නව කදාවක් ඉක්මනින් ඇතුළත් කිරීමට බහුලව භාවිතාවන කෙටි මං යතුර කුමක් ද?
(1) Ctrl+M (2) Ctrl+O (3) Ctrl+P (4) Ctrl+S

13. _____ යනු ප්‍රකාශ ආචයන මාධ්‍යයකි.
ඉහත හිස්තැන පිරවීම සඳහා වඩාත්ම යෝග්‍ය වන්නේ පහත සඳහන් කවරක් ද?
(1) දෘඪ ඩිස්කය (Hard disk) (2) සැනෙලි ධාවකය (Flash drive)
(3) නම්‍ය ඩිස්කය (Floppy disk) (4) බ්ලූ-රේ ඩිස්කය (Blu-Ray disc)

14. සම්මත පැතුරුම්පත් යෙදුමක පවතින B2:D5 සෘජුකෝණාස්‍රාකාර කෝෂ පරාසය සලකා බලන්න. මෙම පරාසය තුළ පවතින තනි කෝෂ එකතුව කොපමණ ද?
(1) 7 (2) 9 (3) 12 (4) 15

15. පහත දැක්වෙන ඒවායින් උකුළු පරිගණකයක තාක්ෂණික පිරිවිතරයක් වන්නේ කුමක් ද?
(1) මිල (2) බර (3) USB කෙවනි ගණන (4) භෞතික ප්‍රමාණය

16. සුහුරු රථ ගාලක නැවතුම් ස්ථාන 5ක් පවතී. එක් එක් ස්ථානයෙහි තත්ත්වය එක් බිටුවකින් (one bit) නිරූපණය කරන අතර 1 මගින් ඉඩ භාවිත වී ඇති බවත් (occupied) හා 0 මගින් ඉඩ පවතින බවත් පෙන්වනු ලබයි. එක්තරා අවස්ථාවකදී, පද්ධතිය මගින් 10110 පෙන්වනු ලබයි. මෙම ද්විමය නිරූපකයට තුල්‍ය දශමය සංඛ්‍යාව කුමක් ද?
(1) 18 (2) 20 (3) 22 (4) 24

17. CPU හි ALUවල ප්‍රධාන කාර්යය භාරය වන්නේ,
(1) ස්පන්ද වේගය කළමනාකරණය කිරීමයි. (2) තාර්කික සහ අංක ගණිතමය ක්‍රියාකාරකම් සිදු කිරීමයි.
(3) අන්තර්ජාල සම්බන්ධතාව සැපයීමයි. (4) ආදාන සහ ප්‍රතිදාන ක්‍රියාකාරකම් සිදු කිරීමයි.

18. බහු-හර සකසනයට (multi-core processor) සාමාන්‍යයෙන් කළ හැක්කේ,
(1) වඩා වැඩි ගොනු සංඛ්‍යාවක් ස්ථිරවම ආචයන කිරීමයි.
(2) අන්තර්ජාල සම්බන්ධතාවයේ බාගත කිරීමේ වේගය වැඩි කිරීමයි.
(3) එකම අවස්ථාවේදී සැකසුම් කාර්යයන් කිහිපයක් සිදු කිරීමයි.
(4) සසම්භාවී ප්‍රවේශ මතකයේ අවශ්‍යතාවය ප්‍රතිස්ථාපනය කිරීමයි.

19. දැනට සැකසෙමින් පවතින දත්ත හා උපදෙස් රඳවා ගන්නේ පරිගණකයක පහත සඳහන් කුමන සංරචකවල ද?
(1) RAM (2) ROM (3) දෘඩ ඩිස්කය (4) රෙජිස්තර

20. දශමය 45 ට තුල්‍ය ද්විමය සංඛ්‍යාව කුමක්ද?
(1) 101011 (2) 101101 (3) 110101 (4) 111001

21. 10111100 යන ද්විමය සංඛ්‍යාවට තුල්‍ය වන ෂඩ්දශම සංඛ්‍යාව කුමක් ද?
(1) AC (2) BC (3) CB (4) B8

22. MICR උපාංග භාවිත කරන්නේ,
(1) තීරු කේත කියවීමට ය.
(2) මයික්‍රෆෝන ආදාන හඳුනාගැනීමට ය.
(3) චුම්භකිත තීන්තවලින් ලියන ලද අනුලක්ෂණ කියවීමට ය.
(4) චුම්භකිත තීන්ත භාවිතයෙන් අනුලක්ෂණ මුද්‍රණයට ය.

23. පරිගණක ජාලයක, නියමු සහිත සහ නියමු රහිත සම්ප්‍රේෂණ මාධ්‍ය අතර ප්‍රධාන වෙනස වන්නේ,

(1) නියමු සහිත මාධ්‍ය සමක්ෂ රැහැන් (coaxial cables) භාවිත කරන අතර, නියමු රහිත මාධ්‍ය ප්‍රකාශ තන්තු (fiber-optic) භාවිත කිරීමයි.

(2) නියමු සහිත මාධ්‍ය භාවිත කරනුයේ කටහඬ සන්නිවේදනය සඳහා පමණක් වන අතර, නියමු රහිත මාධ්‍ය භාවිත කරනුයේ දත්ත සන්නිවේදනය සඳහා පමණක් වීමයි.

(3) නියමු සහිත මාධ්‍ය සංඥා සම්ප්‍රේෂණය සඳහා භෞතික රැහැන් භාවිත කරන අතර, නියමු රහිත මාධ්‍ය වාතය හෝ අවකාශය හරහා සංඥා සම්ප්‍රේෂණය කිරීමයි.

(4) සංඥා සම්ප්‍රේෂණය කිරීම සඳහා නියමු සහිත මාධ්‍ය, චන්ද්‍රිකා (satellites) භාවිත කරන අතර, නියමු රහිත මාධ්‍ය රැහැන් භාවිත කිරීමයි.

24. පරිගණක ජාලයක (computer network) ප්‍රධාන අරමුණ කුමක් ද?

(1) පරිගණකයෙහි ඇති සැකසුම් බලය වැඩි කිරීමයි.

(2) පරිගණකවල වෛරස පැතිරවීම වැලැක්වීමයි.

(3) පරිගණක අතර තොරතුරු හා සම්පත් හුවමාරු කිරීමයි.

(4) පරිගණකවල ගබඩා ධාරිතාව වැඩිකිරීමයි.

25. assignment.docx ගොනුවේ docx යන අක්ෂර හතර මගින් හඳුන්වනු ලබන්නේ,

(1) ගොනු වාසගමයි. (2) ගොනු ප්‍රරූපයයි. (3) යෙදුම් ලේඛලයයි. (4) ගොනු දිගුවයි.

26. පුද්ගල ප්‍රදේශ ජාලයක් (Personal Area Network) නිර්මාණය කිරීම සඳහා ප්‍රධාන හේතුව කුමක් ද?

(1) වෙනත් රටවල් අතර පරිගණක සම්බන්ධ කිරීම සඳහා

(2) කෙටි පරාසයක් තුළ පුද්ගල උපාංග (devices) සම්බන්ධ කිරීම සඳහා

(3) විවිධ කාර්යාලවල ඇති පරිගණක සම්බන්ධ කිරීම සඳහා

(4) මුළු නගරයකට අන්තර්ජාල පහසුකම් ලබාදීම සඳහා

27. පැතුරුම්පත් සූත්‍රයක දී නිරපේක්ෂ යොමුවක් (absolute reference) බවට පත් කිරීමට පේළි අංකය හෝ තීරු අක්ෂරය ඉදිරිපසට එක් කළ යුතු සංකේතය කුමක් ද?

(1) # (2) $ (3) % (4) &

28. පහත දැක්වෙන පැතුරුම්පත් සූත්‍රයේ (spreadsheet formula) ප්‍රතිඵලයෙහි අගය කුමක් ද?

=5 + 3 * 2 ^ 2 - 8 / 4

(1) 11 (2) 15 (3) 19 (4) 30

29. සාර්ව ද්‍රව්‍ය අන්තර්ජාලයෙහි (IoT) අවශ්‍යතාව සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ සලකා බලන්න.

A - භෞතික උපාංග සම්බන්ධ කර, දත්ත රැස් කිරීමට, හුවමාරු කිරීමට සහ සැකසීමට ඒවාට හැකියාව ලබාදීම

B - දුරස්ථව උපාංග නිරීක්ෂණය සහ පාලනය කිරීම

C - මානව ශ්‍රමය අඩු කිරීම සහ මෙහෙයුම් පිරිවැය වැඩි කිරීම

ඉහත සඳහන් ඒවායින් සාර්ව ද්‍රව්‍ය අන්තර්ජාලයෙහි අවශ්‍යතාව නිවැරදිව ප්‍රකාශ කරන්නේ කවරක් ද?

(1) A සහ B පමණි. (2) A සහ C පමණි.

(3) B සහ C පමණි. (4) A, B සහ C සියල්ලම.

30. වදන් සකසනයක පේළි පරතරය 2.0 ට (double space) සිටුවම් කිරීමේ දී (setting) සැබැවින් සිදුවන්නේ කුමක් ද?

(1) තෝරාගත් සියලුම පාඨ කොටසෙහි අක්ෂර හැඩයෙහි ප්‍රමාණය දෙගුණ කිරීම

(2) පිටුවෙහි සීමාවන්හි (margins) පළල දෙගුණයක් කිරීම

(3) ඡේදයක පාඨයන්හි එක් එක් පේළි අතර සිරස් පරතරය දෙගුණයක් කිරීම

(4) සෑම ඡේදයකටම පසු හිස් පිටු දෙක බැගින් ඇතුළත් (inserts) කිරීම

31. පහත දැක්වෙන කවර හැඩසවු ගැන්වීමේ මෙවලමක් (formatting tool) මගින් තෝරාගත් කාණ්ඩයක විශේෂිත ශෛලීන් (specific styling, font, font size, font colour, and boldface ආදිය වැනි) වෙනත් පාඨ කොටසකට ක්ෂණිකව පිටපත් කිරීමට යොදා ගත හැකි වන්නේ ද?

(1) Format Painter (2) Copy and Paste

(3) Text Highlight Colour (4) Clear All Formatting

32. GSM සහ GPRS අතර ප්‍රධාන ක්‍රියාකාරී වෙනස්කම කුමක් ද?

(1) දත්ත සම්ප්‍රේෂණයේ දී GSM හා GPRS නියත වශයෙන්ම එකම ක්‍රමයක් භාවිත කරයි.

(2) GSM අන්තර්ජාල ප්‍රවේශය සඳහාම පමණක් භාවිත වන අතර GPRS කථන ඇමතුම් සඳහාම පමණක් භාවිත කරයි.

(3) GSM කථනය සඳහා circuit-switched සන්නිවේදනය ප්‍රධාන වශයෙන් භාවිතා කරන අතර GPRS දත්ත සඳහා packet-switched සන්නිවේදනය භාවිත කරයි.

(4) GSM සන්නිවේදනය සඳහා චන්ද්‍රිකා භාවිත කරන අතර, GPRS ප්‍රකාශ තන්තු භාවිත කරයි.

33. පහත ප්‍රකාශ අතුරෙන් කවරක් ජාල අතුරු මුහුණත් කාඩ්පතෙහි (NIC) ක්‍රියාකාරී මෙහෙයුම දක්වයි ද?
(1) එය පරිගණකය හා ජාලය අතර අතුරු මුහුණතක් සපයයි.
(2) එය පරිගණකයේ විදුලිබල සැපයුම පාලනය කරයි.
(3) එය පරිගණකයේ ගබඩා ධාරිතාව (Storage Capacity) වැඩි කරයි.
(4) එය යෙදුම් මෘදුකාංග කළමනාකරණය කරයි.

34. පහත කවරක් පරිගණක ජාලයක් ස්ථාපිත කිරීම සඳහා මූලික අවශ්‍යතාවයක් වන්නේ ද?
(1) ජාල උපකරණ සහ සන්නිවේදන මාධ්‍ය
(2) ජාල අතුරු මුහුණත් කාඩ්පත (NIC)
(3) ජාලගත මුද්‍රණ යන්ත්‍ර
(4) මංහසුරුව (Router)

35. සංඛ්‍යා පද්ධතියක පාදය (base) හෙවත් මූලකය (radix) මගින් දක්වනු ලබන්නේ,
(1) සංඛ්‍යා පද්ධතිය භාවිතයෙන් නිරූපණය කළ හැකි උපරිම අගයයි.
(2) සංඛ්‍යා පද්ධතියෙහි භාවිත වන විවිධ සංකේත සංඛ්‍යාවයි.
(3) සංඛ්‍යාවක් නිරූපණය කිරීම සඳහා අවශ්‍ය බිට්ටු (bits) සංඛ්‍යාවයි.
(4) සංඛ්‍යාවක් අඛණ්ඩව කිරීම සඳහා අවශ්‍ය බයිට සංඛ්‍යාවයි.

36. 1 වන රූපයෙන් 2 වන රූපය ලබා ගැනීමට පහත දැක්වෙන කුමන ක්‍රියාකාරකම් සිදු කර තිබේද?
(රූප ප්‍රභවය : අන්තර්ජාලයෙනි)



1 වන රූපය



2 වන රූපය

(1) Cropping සහ Resizing
(2) Cropping සහ Sharpening
(3) Resizing සහ Sharpening
(4) Overlaying සහ Resizing

37. දෛශික චිත්‍ර (Vector Graphics) ආචයනය කිරීම සඳහා පහත කුමන ගොනු ආකෘතිය පොදුවේ භාවිත වන්නේද?
(1) JPEG (2) PNG (3) SVG (4) BMP

38. බහුමාධ්‍ය (multimedia) ගොනු ආකෘති පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.
A - JPEG විනිවිද පෙනෙන (transparency) සහ හානි රහිත (loseless) හැකිළීම (compression) සඳහා සහාය වේ.
B - MP3 ශ්‍රව්‍ය ගොනු ආචයනය කිරීම සඳහා පොදුවේ භාවිත වේ.
C - PNG හානි රහිත අනුරූ හැකිළීමට (image compression) සහාය දක්වයි.
ඉහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේද?
(1) A පමණි. (2) B පමණි. (3) A සහ C පමණි (4) B සහ C පමණි.

39. සංඛ්‍යාංක අනුරූ (digital images) පිළිබඳ පහත ප්‍රකාශ සලකන්න.
A - රාස්ටර රූප (Raster images) පික්සලවලින් සමන්විත වේ.
B - රූපයක තත්ත්වය (image quality) හානි නොවන සේ දෛශික රූප (Vector images) ප්‍රතිප්‍රමාණය (resize) කළ හැකිය.
C - රාස්ටර රූපයක විභේදනය (resolution) වැඩි කිරීමේදී සෑමවිටම එම ගොනුවෙහි ප්‍රමාණය (file size) අඩුවේ.
ඉහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේද?
(1) A පමණි. (2) B පමණි. (3) A සහ B පමණි. (4) B සහ C පමණි.

40. පරිගණකවල අනුලක්ෂණ (character) නිරූපණය සම්බන්ධයෙන් නිවැරදි වන්නේ පහත කුමන වගන්තිය ද?
(1) ASCII වලින් Unicode වලට වඩා වැඩි අනුලක්ෂණ සංඛ්‍යාවක් නිරූපණය කළ හැකි ය.
(2) සංඛ්‍යාත්මක දත්ත නිරූපණය සඳහා පමණක් Unicode භාවිත වේ.
(3) විවිධ භාෂාවල අනුලක්ෂණවලට Unicode සහාය දක්වයි.
(4) ASCII හා Unicode වලට ඉංග්‍රීසි අනුලක්ෂණ නිරූපණය කළ නොහැකි ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

GIT S I, II

සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය 2026
பொதுத் தகவல் தொழில்நுட்பப் பரீட்சை 2026
General Information Technology Examination 2026

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය I, II
பொதுத் தகவல் தொழில்நுட்பவியல் I, II
General Information Technology I, II

සාමාන්‍ය තොරතුරු තාක්ෂණය II

※ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.

1. ඔබගේ පරිගණකය ක්‍රියාත්මක කර ඇති අතර වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය එහි තිරය මත දිස්වන බව උපකල්පනය කරන්න. ඔබ මෙම පරිගණකයට ප්‍රවේශ වී ඇත්තේ (logged on) Admin ලෙස නම් කරන ලද පරිපාලක ගිණුමක් (administrator) හරහා ය. මෙම පරිගණකයේ දෘඪ ඩිස්කය C: ධාවකය (drive) ලෙස හැඳින්වේ. C:\Users\Admin\Downloads හි ඇති Downloads ෆෝල්ඩරයේ https://www.doenets.lk/pastpapers වෙතින් බාගත කළ 80-e-git2025.pdf ලෙස නම් කරන ලද 2025 GIT විභාගයේ පසුගිය ප්‍රශ්න පත්‍රය පවතී. පසුගිය වසර 5ක උසස් පෙළ විභාගයේ ප්‍රශ්නපත්‍ර අඩංගු වන Papers ෆෝල්ඩරය C:\Users\Admin\Documents\Papers හි පවතී.

(*a*) පහත දැක්වෙන කාර්යයන් ඉටු කිරීම සඳහා අත්‍යවශ්‍ය පරිගණක මෙහෙයුම් (operation) ලියා දක්වන්න.

(i) Downloads ෆෝල්ඩරය විවෘත කිරීම

(ii) 80-e-git2025.pdf ගොනුව Downloads ෆෝල්ඩරයේ සිට Papers ෆෝල්ඩරයට ගෙන යාම (move)

(iii) අළුතින් ගෙන ආ 80-e-git2025.pdf ගොනුව GIT-2025.pdf ලෙස නැවත නම් කිරීම (Rename)

(*b*) ඔබගේ මිතුරකු ඔබට සැනෙලි මතක ධාවකයක් (flash drive) ලබා දී Papers ෆෝල්ඩරයේ ඇති පසුගිය AL 2025 විභාගයේ පසුගිය ප්‍රශ්න පත්‍රවල පිටපත් පමණක් AL_2025.zip ලෙස නම් කරන ලද තනි ගොනුවක් සේ ලබා දෙන (share) ලෙස ඉල්ලා සිටින්නේ යැයි සිතන්න. සැනෙලි මතක ධාවකය, පරිගණකයේ USB කෙවනියකට සම්බන්ධ කළ විට, එය F: ධාවකය ලෙස හඳුනා ගනී. මෙහෙයුම අවසන් වූ විට, මුල් ප්‍රශ්නපත්‍ර හා නිර්මාණය කරන ලද AL_2025.zip ගොනුව Papers ෆෝල්ඩරයේ ම පැවතිය යුතු ය. ඔබේ මිතුරාගේ අවශ්‍යතාවය සපුරාලීමට ගත යුතු අත්‍යවශ්‍ය පරිගණක මෙහෙයුම් ලියන්න.

2. ඔබගේ පාසලේ ශිෂ්‍ය සංගමය මගින් විවේක කාලයන් හි පාසැල් බොජුන්හල ක්‍රියාත්මක කරන්නේ යැයි උපකල්පනය කරන්න. ශිෂ්‍යයන් විසින් සතියකදී අලෙවි වූ ද්‍රව්‍යවල මිල හා ලාභ නිරීක්ෂණය සඳහා දත්ත පැතුරුම්පතක වාර්තා කර තබා ගනී. පහත දක්වා ඇත්තේ පසුගිය සතිය තුළ ජනප්‍රිය අයිතම පහක් සඳහා වූ අලෙවි දත්ත නිරීක්ෂණය සඳහා භාවිත කරන ලද අසම්පූර්ණ පැතුරුම්පතකි.

	A	B	C	D	E	F	G
1	**Item Name**	**Cost Price (LKR)**	**Selling Price (LKR)**	**Units Sold**	**Total Revenue (LKR)**	**Item Profit (LKR)**	**Total Profit (LKR)**
2	Fruit Cup	150	250	45			
3	Thosai	40	60	80			
4	Vegetable mixed rice	70	100	65			
5	Fresh mixed fruit juice	80	120	50			
6	Corn Soup	50	75	120			
7	**Total**						
8	**Average**						

(*a*) 'Fruit Cup' සඳහා මූල්‍යමය ප්‍රතිඵල ගණනය කිරීමට පහත දක්වා ඇති කෝෂවලට (cells) සිසුන් විසින් ඇතුළත් කළ යුතු පැතුරුම්පත් සූත්‍ර (formula) ලියා දක්වන්න.

(i) E2 කෝෂයෙහි දී 'Total Revenue' ගණනය කිරීමට (Units Sold, Selling Price මගින් ගුණ කිරීමෙන්)

[සයවැනි පිටුව බලන්න.

(ii) F2 කෝෂයෙහි දී 'Item Profit' ගණනය කිරීමට (එක් අයිතමයක් සඳහා වූ ලාභය)

(iii) එම අයිතමය සඳහා G2 කෝෂයෙහි දී 'Total Profit' ගණනය කිරීමට (Item profit, Units Sold මගින් ගුණ කිරීමෙන්)

(*b*) E2 කෝෂයේ සිට පහළට E6 කෝෂය දක්වා වෙන වෙනම යතුරු ලියනය කිරීමකින් තොරව අදාළ සූත්‍රවලින් පිරවීම (fill) සඳහා සිසුන්ට භාවිත කළ හැකි ඉක්මන්ම ක්‍රමවේදය සඳහන් කරන්න.

(*c*) විකුණන ලද අයිතමවල මුළු එකතුව D7 කෝෂයෙහි පෙන්වීමට සූත්‍රයක් පැතුරුම්පත් තුළ පවතින (built-in) ශ්‍රිතයක් (function) භාවිත කර ලියා දක්වන්න.

(*d*) සියලු අයිතම සඳහා විකුණුම් මිලෙහි සාමාන්‍යය (average) C8 කෝෂයෙහි පෙන්වීමට සූත්‍රයක් ලියා දක්වන්න.

(*e*) බොජුන්හලේ ප්‍රගතිය හාර ගුරුභවතා වෙත පෙන්වීමට සිසුනට ඔවුන්ගේ දත්තවල දෘශ්‍ය නිරූපණයක් පෙන්වීමට අවශ්‍යව පවතී.

(i) එක් එක් තනි අයිතමයන්ගේ මුළු ලාභය සංසන්දනාත්මකව පෙන්වීම සඳහා වඩා උචිත වන්නේ කවර වර්ගයේ ප්‍රස්තාරයක් ද? (උදා. ස්ථම්භ/තීරු/රේඛීය) ඔබේ තේරීමට හේතු පැහැදිලි කරන්න.

(ii) Item names සහ Item profit යන දෙකෙහිම අගයන් නිවැරදිව ඉහත ප්‍රස්තාරය මගින් ලබා ගැනීම සඳහා, ශිෂ්‍යයන් විසින් ලබා දිය යුතු (ශීර්ෂ නාම අන්තර්ගතව) නිශ්චිත කෝෂ පරාසයන් ලියා දක්වන්න.

3. ඩිජිටල් ඉලෙක්ට්‍රොනික්ස් සඳහා වූ මූලික තැනුම් ඒකක වන්නේ තර්කන ද්වාරයන් ය. මේවා පරිගණක ඇතුළු බොහෝ ඩිජිටල් ඉලෙක්ට්‍රොනික පද්ධතිවල යොදා ගනු ලබන්නේ විවිධ වූ අදාන කොන්දේසි මත පදනම් ව තර්කන මෙහෙයුම් සිදු කිරීමට සහ තර්කන තීරණයන් ගනු ලැබීමට ය.

(*a*) ආරක්ෂාව සඳහා, නවීන මෝටර් රථවල එන්ජිම පණගැන්විය හැකි වන්නේ, තිරිංග පැඩලය පාගා ගෙන ඒ අතරතුර ජ්වලන ස්විච්චිය ක්‍රියාත්මක කර (on) ඇති නම් පමණකි.

A, B හා Q ලේබල මගින් අනුපිළිවෙළින් ජ්වලන ස්විච්චිය, තිරිංග පැඩලය හා එන්ජිම නිරූපණය වේ. ක්‍රියාත්මක කිරීම (on)/පාගා ඇතිවිට (pressed)/පණගැන්වීම (started) සහ ක්‍රියාත්මක නොවීම (off)/ පාගා නැතිවීම (not pressed)/ පණගැන්වීම නොමැති වීම (not started) යන අවස්ථා පිළිවෙළින් 1 හා 0 මගින් නිරූපණය වේ.

(i) A, B හා Q අතර සම්බන්ධය (relationship) පෙන්වීමට සත්‍යතා වගුවක් නිර්මාණය කරන්න.

(ii) ඉහත සත්‍යතා වගුව සඳහා බූලියානු ප්‍රකාශනය ලියන්න.

(iii) ඉහත කාර්යන් (functionality) ක්‍රියාත්මක කිරීම සඳහා කුමන තර්කන ද්වාරය භාවිත කළ හැකි ද? තර්කන ද්වාරයේ සංකේතය අඳින්න.

(*b*) අතිරේක ආරක්ෂිත පියවරක් ලෙස මෝටර් වාහනයක අඩුතරමින් එක් දොරක් හෝ විවෘතව පවතින විටක දී, අනතුරු සංඥාවක් ලෙස ඩෑෂ් පුවරුවේ බල්බයක් දැල්වේ. දොර දෙකක් සහිත වාහනයක් සඳහා A, B හා Q ලේබල මගින් පිළිවෙළින් රියදුරු පස දොර, මගී පස දොර හා අනතුරු සංඥා බල්බය දැක්වේ. විවෘත බව/බල්බය දැල්වීම සහ සංවෘත බව/බල්බය නොදැල්වීම සඳහා අවස්ථා පිළිවෙළින් 1 සහ 0, මගින් නිරූපණය වේ.

(i) A, B හා Q අතර සම්බන්ධය දැක්වීම සඳහා සත්‍යතා වගුවක් නිර්මාණය කරන්න.

(ii) ඉහත සත්‍යතා වගුව සඳහා බූලියානු ප්‍රකාශනය ලියන්න.

(iii) ඉහත කාර්යය ක්‍රියාත්මක කිරීම සඳහා කුමන තර්කන ද්වාරය භාවිත කළ යුතු ද? තර්කන ද්වාරයේ සංකේතය අඳින්න.

4. ඔබේ පාසලේ පොත්හලෙහි කළමනාකරු එහි ඇති භාණ්ඩවල විස්තර නඩත්තු කිරීම සඳහා දත්ත සමුදායක් භාවිත කරයි. PRODUCT වගුවේ කොටසක් පහත දක්වා ඇත.

Product_ID	Product_Name	Quantity	Unit_Price	Supplier_ID
P001	Pencil	30	20.00	S01
P002	Pen	25	30.00	S02
P003	Eraser	40	10.00	S01
P004	Ruler	50	25.00	S03
P005	Scissor	20	60.00	S02

භාණ්ඩවල තොරතුරු පවත්වාගැනීම හා ලබාගැනීම සඳහා කළමනාකරුට ඉහත දත්ත සමුදාය භාවිත කිරීම අවශ්‍ය වේ. පහත දෑ දක්වමින් කළමනාකරු සඳහා ලේඛනයක් සකස් කරන්න.

(*a*) දත්ත සමුදා කළමනාකරන පද්ධතියක (DBMS) අරමුණක් සඳහන් කරන්න.

(*b*) ඉහත දක්වා ඇති PRODUCT වගුව පරීශීලනයෙන් එහි අඩංගු

(i) ක්ෂේත්‍ර (fields) සංඛ්‍යාව ලියන්න.

(ii) රෙකෝඩ් (records) සංඛ්‍යාව ලියන්න.

(c) පහත එක් එක් ක්ෂේත්‍රය සඳහා වඩාත් යෝග්‍ය දත්ත ප්‍රරූපය සඳහන් කරන්න.

(i) `Product_Name`

(ii) `Quantity`

(iii) `Unit_Price`

(d) ප්‍රමාණයන් 30 ට වඩා අඩු භාණ්ඩ පමණක් පෙන්වීමට (display) කළමනාකරුට අවශ්‍යවේ පවතී.

(i) මෙම කාර්යය සඳහා භාවිත කළ යුතු දත්ත සමුදා object එක හඳුන්වන්න.

(ii) පෙන්වනු ලැබිය හැකි Product_ID සඳහන් කරන්න.

(e) පහත දක්වා ඇති එක් එක් අවශ්‍යතාවයන්ට වඩාත්ම යෝග්‍ය වන දත්ත සමුදා object හඳුනා ගන්න.

(i) භාණ්ඩවල විස්තර ඇතුළු කිරීම හා සංස්කරණය කිරීම සඳහා භාවිතා මිතුරු අතුරුමුහුණතක් ලබාදීමට

(ii) මුද්‍රණයට යෝග්‍ය, නිසි ලෙස සැකසූ (well-formatted) මාසික තොග භාණ්ඩ සාරාංශයක් (monthly stock summary) නිර්මාණය කිරීමට

5. ඔබේ පාසල සඳහා බලශක්ති පරිභෝජනය අඩු කිරීමට, පන්ති කාමර කළමනාකරණය දියුණු කිරීමට සහ අසාමාන්‍ය විදුලි භාවිතය හඳුනා ගැනීමට අවශ්‍ය වී ඇත. ඒ සඳහා පාසල් පරිපාලනය විසින් පන්ති කාමරවල සිටින පුද්ගලයන් සංඛ්‍යාව, උෂ්ණත්වය, ආලෝකය සහ විදුලි පරිභෝජනය නිරීක්ෂණය කිරීම සඳහා උපාංග කීපයක් සවිකරන ලදී. පාසල් පරිපාලකයන්ට අන්තර්ජාලය ඔස්සේ ක්‍රියාත්මක වන පුවරුවක් (dashboard) හරහා මෙම තොරතුරු නිරීක්ෂණය කිරීමටත්, ආලෝක පද්ධති සහ වායු සමීකරණ පද්ධති ස්වයංක්‍රීයව පාලනය කිරීමටත් හැකියාව ඇත.

(a) යෝජිත ආකෘතිය IoT (Internet of Things) යෙදුමක් ද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න.

(b) මෙම අවස්ථාවේ භාවිත වන IoT සංරචක **දෙකක්** හඳුනා ගෙන ඒ එක් එක් සංරචකයේ ක්‍රියාකාරිත්වය පැහැදිලි කරන්න.

(c) මෙම පද්ධතිය තුළ වලාකුළු පරිගණකකරණය (Cloud Computing) තාක්ෂණය සහාය වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

(d) බලශක්ති පරිභෝජනය අඩු කර ගැනීමට මෙම පද්ධතිය පාසලට උපකාරී වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

(e) එක්තරා පන්ති කාමරයක් හිස්ව පවතින බව සංවේදකය මගින් පෙන්නුම් කළ ද, එම කාමරයේ විදුලිය පරිභෝජනය වන බව පාසල් පරිපාලනය සොයාගනී. මෙම තත්ත්වයට බලපාන හේතු **දෙකක්** සඳහන් කර පාසල මගින් සැබෑ හේතුව තහවුරු කර ගන්නේ කෙසේ දැයි පැහැදැලි කරන්න.

(f) මෙම පද්ධතියේ ආරක්ෂක අවදානම් **දෙකක්** හඳුනාගෙන ඒ සඳහා සුදුසු විසඳුම් ලබා දෙන්න.

6. සිසුන්ගේ විභාග ප්‍රතිඵල ප්‍රදර්ශනය කිරීම සඳහා සරල HTML වෙබ් පිටුවක් නිර්මාණය කිරීමට පාසල් සිසුවෙකුට අවශ්‍යව ඇත. එම පිටුව මගින් සිසුවාගේ මූලික තොරතුරු, විෂයයන්, ශ්‍රේණි සහ ප්‍රතිඵලවලට අදාළ වැදගත් තොරතුරු පැහැදිලිව දැක්විය යුතුය. පහත දී ඇති ආදර්ශ වෙබ් පිටුව සලකන්න.

G.C.E. A/L Examination Results

---

1. **Name: Kamal Perera**
2. **Index No: 1234567**
3. **Year: 2026**

Subject	Grade
Mathematics	A
Chemistry	B
Physics	A

- **Results are subject to confirmation.**
- **Results are for information purposes only.**

පහත අවශ්‍යතා අනුව වෙබ් පිටුවක් ප්‍රදර්ශනය වන පරිදි HTML කේතයක් සකසන්න. ඔබේ HTML කේතය තුළ <html>, <head>, <title>, <body> සහ උසුලන (tags) ඇතුළුව නිවැරදි HTML ලේඛන ව්‍යුහය අඩංගු විය යුතු ය.

(a) පිටු මාතෘකාව (page title) '**Examination Results**' ලෙස සකසන්න.

[අවසාන පිටුව බලන්න.

(*b*) **'G.C.E. A/L Examination Results'** යන්න 2 වන මට්ටමේ ශීර්ෂයක් (level 2 heading) ලෙස ප්‍රදර්ශනය කරන්න.

(*c*) **'G.C.E. A/L Examination Results'** යන්නට පසුව තිරස් රේඛාවක් (horizontal line) එක් කරන්න.

(*d*) රූපයේ දැක්වෙන පරිදි ආදර්ශ දත්ත සහිතව පහත දෑ ප්‍රදර්ශනය කිරීමට අනුක්‍රමික ලැයිස්තුවක් (ordered list) භාවිත කරන්න.

(i) Student Name

(ii) Index Number

(iii) Year of Examination

(*e*) තීරු දෙකකින් (**Subject** සහ **Grade**) යුත් වගුවක් සකසන්න.

(*f*) වගුවේ ශීර්ෂ පේළියට (**heading row**) පසුබිම් වර්ණයක් (**background colour**) එකතු කරන්න.

(*g*) රූපයේ දැක්වෙන පරිදි අදාළ ශ්‍රේණි (grades) සමග පහත විෂයයන් ඇතුළත් කරන්න.

(i) Mathematics

(ii) Chemistry

(iii) Physics

(*h*) පහත දෑ ප්‍රදර්ශනය කිරීමට අනුක්‍රමික **නොවන** ලැයිස්තුවක් (unordered list) භාවිත කරන්න.

(i) **Results are subject to confirmation**

(ii) **Results are for information purposes only**

7. ඔබේ පන්තිය හමුවේ ඉදිරිපත් කිරීම සඳහා 'ශ්‍රී ලංකාවේ දියඇලි' පිළිබඳ සමර්පණයක් (presentation) සකස් කිරීමට ඔබට අවශ්‍යව ඇත. එම සමර්පණයේ කදා (slides) පිළිබඳ විස්තර පහත දැක්වේ.


1 වන කදාව – ඉදිරිපත් කිරීමේ මාතෘකාව
ඔබේ නම සහ ඉදිරිපත් කිරීමේ දිනය සමග



2 වන කදාව – ශ්‍රී ලංකාව සහ දියඇලි පිළිබඳ කෙටි විස්තරයක්

3 සිට 5 වන කදාව

දුන්හිඳ, දියලුම සහ බඹරකන්ද යන ප්‍රධාන දියඇලි තුන වෙන වෙනම දැක්වෙන කදා තුනකි. රූප සටහනේ දැක්වෙන පරිදි, එක් එක් කදාවෙහි වම් පසින් දියඇල්ල පිළිබඳව කරුණු ද, දකුණු පසින් දියඇල්ලේ ඡායාරූපයක් ද ඇතුළත් කළ යුතු ය.



6 වන කදාව – ආශ්‍රිත මූලාශ්‍ර (උදා: අන්තර්ජාලයෙන් ලබාගත් විස්තර සහ පින්තූර)

(*a*) PowerPoint සමර්පණය ආකර්ෂණීය සහ ඵලදායි කර ගැනීම සඳහා ඔබ අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග **තුනක්** ලියා දක්වන්න.

(*b*) සම්පූර්ණ සමර්පණය (1 සිට 6 දක්වා වූ කදා) නිර්මාණය කිරීම සඳහා ඔබ අනුගමනය කරන පියවර කෙටියෙන් පැහැදිලි කරන්න.

(*c*) මාතෘකා පිටුවේ ඇති තොරතුරුවල අදාළත්වය කුමක් ද?

(*d*) ප්‍රේක්ෂකයින් (එනම් පන්තිය) සඳහා සමර්පණය ඉදිරිපත් කිරීමේ දී ඔබ භාවිතා කළ යුත්තේ කුමන මෙනු පටිත්ත (Menu Tab) ද?

(*e*) 'ආශ්‍රිත මූලාශ්‍ර' (References) හි වැදගත්කම කුමක් ද?

* * *